# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2371/40 - 2024 පෙබරවාරි මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2024.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේඅංකය:* DIVKB/LND/LA/DSKAQ/10.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/5/2019/HA/262.

කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1308 අරළුගස්වැව ග්‍රාම නිලධාරී වසමේ ඉහළ අරළුගස්වැව ගමේ පිහිටි කුරුණෑගල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2023.10.30 දින පිළියෙල කර ඇති කැඩැස්තර සිතියම් අංක 420722 හි, කලාප අංක 03, පත්‍ර අංක 01 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4846 වන පහත විස්තර සඳහන් ඉඩම :

කැබලි අංක 01
ඉඩමේ නම: කහටගහමුලහේන, කෝන්ගහමුලහේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත, හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා අවශ්‍ය වී ඇත; ප්‍රමාණය: හෙක්: 0.4846.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024 අප්‍රේල් මස 22 වැනි දින පෙ.ව. 10.00 ට කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2024 අප්‍රේල් මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ඩබ්ලිව්. තිළිණි නිසංසලා සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
කොබෙයිගනේ.

2024 පෙබරවාරි මස 09 වැනි දින,
කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02-0109